# වාසනාවන්ත සමාජයක්

අනුරාධපුර ශ්‍රී සාරානන්ද පිරිවෙනේ පැවති

දහම් හමුවේ දී

ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදස මැතිතුමා

පැවැත්වූ කථාව

1991.03.29

# වාසනාවන්ත සමාජයක්

## අනුරාධපුර ශ්‍රී සාරානන්ද පිරිවෙනේ පැවති
## දහම් හමුවේ දී

## ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා
## පැවැත්වූ කථාව

"අප බෙහෙවින් වැරැදිකරන්නේ වැරැදි තීරණ නිසයි. වැරැදි තීරණ ගන්නේ හිතෙන්. ඒ හිත නිවැරැදි තීරණ ගන්නා තත්ත්වයකට අප සංවිධාන කරගත්තොත් මෙයට වඩා දුකින් තොර ජීවිත ගත කරන්නට පුළුවන් වෙනවා"

– රණසිංහ ප්‍රේමදාස

1991.03.29

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## 1991.03.29 වැනි දින
## අනුරාධපුර ශ්‍රී සාරානන්ද පිරිවෙනේ පැවති දහම් හමුවේ දී ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා කළ කථාව

මේ බක් මහ පෝය දිනයේ දී, තමුන්නාන්සේලා අප සියලු දෙනාට ම, ධර්මය ගැන හිතන්නට, අවකාශයක් ලැබී තිබෙනවා. මේ වෙලාවේ, අපේ ගරුතර මහා සංඝ රත්නය මෙන් ම, අට සිල් සමාදන් වුණ විශාල පිරිසක්, අද මේ සාරානන්ද පිරිවෙනේ එක් රැස් වී සිටිනවා. තරුණ කටයුතු හා ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශයේ මෙහෙයීමෙන්, පුනරුත්ථාපනයට යොමු වී සිටින, තරුණයනුත් විශාල වශයෙන් මෙහි සිටින ආකාරය මට පෙනෙනවා.

### 1971 අරගලය

තමුන්නාන්සේලා දන්නවා, අපේ රටේ, තරුණ පිරිස, 1971 දී මේ රටේ ඇති වුණ අරගලයකට මැදි වුණ බව, හැම දෙනා ම නොවෙයි, සෑහෙන පිරිසක්. ඒ අවස්ථාවේ දී අප හිටියේ, ප්‍රතිපක්ෂයේ. එ ද රජය ඒ ඇති වුණ දරුණු තත්ත්වය මර්දනය කරන්නට ක්‍රියා කළා. හදිස්සියෙ ම වාගේ පොලිස් ස්ථානවලට පහර දෙන්නට පටන් ගත්තා. ඒ පහර දීම හේතු කර ගෙන, රට පුරා ම, භීෂණ තත්ත්වයක් ඇති වුණා.

මේ තරුණ කණ්ඩායමක් මෙ සේ කළා ය කියලා, මුළු තරුණ පිරිස කෙරෙහි ම, ලොකු කෝපයක්, වෛරයක්, ඇතැම් අය තුළ ඇති වුණා. ඒ නිසයි, මා කිව්වේ, 1971 දීත්, අපේ තරුණ පිරිස මෙ වැනි තත්ත්වයකට මැදි වුණා ය කියලා. ඊට සම්බන්ධ වුණ අය පමණක් නොවෙයි, අසම්බන්ධ ව සිටි තරුණ පෙළ කෙරෙහි ලොකු අප්‍රසාදයක් ඇති කරගත්තා. කොයි තරමට අප්‍රසාදය ඇති වුණා ද කියලා කිව්වොත්, තරුණයකු දැක්කා නම් හිරබාරයට ගන්නට පෙලඹුණා.

ප්‍රතිපක්ෂයේ හිටපු අප ඒ අවස්ථාවේ දී කල්පනා කළේ ජනතාව ගේ කැමැත්තෙන්, සර්වජන ඡන්ද බලයෙන්, පත් වී තිබෙන රජයක් චණ්ඩි බලයෙන්, දමරික බලයෙන්, අවි ආයුධ බලයෙන්, පෙරළා දැමීමට ඉඩ දීම රටට කරන මහ හානියක් කියලා. එ ද ආණ්ඩුවට හදිසි නීතිය පනවන්නට සිද්ධ වුණා, ඇඳිරි නීතිය පනවන්නට සිද්ධ වුණා. ත්‍රි විධ හමුදාවටත්, පොලිසියටත්, සාමය ආරක්ෂා කරන්නට බලය පවරන්නට සිද්ධ වුණා.

ප්‍රතිපක්ෂයේ අප හිටියෙ ඒ වෙලාවෙ. 1965 ඉඳලා 70 වෙන කල්. රජය පවත්වාගෙන ගිය කණ්ඩායම අපි. අප පරාජය කරලා බලයට පත් වෙච්ච, රජයට තව ම අවුරුද්දක් වත් සම්පූර්ණ වුණේ නැහැ. ඒ රජයට විරුද්ධ ව කැරලි ගහපු, ඒ තරුණ පිරිස, අපේ රජය පරාජය කරන්නට අලුත් රජයට උදවු කරපු පිරිස. ඒ පිරිස කිව්වා, අපට දීපු පොරොන්දු ඉෂ්ට කළේ නෑ. ඒකියයි, අප මේ කැරලි ගහන්නෙ කියලා. නමුත් පැරදිලා ඉන්න ප්‍රතිපක්ෂයකට, සාමාන්‍යයෙන්, ඒ වෙලාවට කල්පනා වෙනවා, ඔන්න අප පැරුද්දුවානෙ, ඒගොල්ලන්ට දිනන්නට, උදවු කරපු අය ම දැන් ගහනවා, මේ අපට කරපු වරදට, හොඳ ප්‍රතිප්‍රහාරයක්. අපත් ඒ තරුණ පිරිසට උදවු කරන්ට ඕනැ ය කියලා අදහස් පහළ වෙනවා. එහෙත් ඒ වෙලාවේ, ප්‍රතිපක්ෂයේ හිටපු අප, එහෙම කල්පනා කළේ නැහැ. එ ද ප්‍රතිපක්ෂයේ නායකත්වය දැරුවෙ, අපේ හිටපු ජනාධිපති, ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා.

මට මතක යි, 1971 අප්‍රියෙල් මාසෙ 05 වැනි ද, පාර්ලිමේන්තුව තිබුණ දවසක්. වැල්ලවායෙන් එල්ලකරපු මේ ප්‍රහාරය, රට පුරා ම පැතිරෙන කොට, 71 අප්‍රියෙල් මාසෙ 05 වැනි ද අපට පෙනුණා ආංඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු එ ද පාර්ලිමේන්තුවට ඇවිල්ලා නොසිටපු බව. ඒකෙන් පෙනුණා, දරුණු තත්ත්වයක් ඇති වෙන ආකාරය. අප, ඊට පස්සෙ ප්‍රතිපක්ෂය වශයෙන් රුස් වුණා. ඒ වෙලාවේ ප්‍රතිපක්ෂයේ නායකතුමා අපට කිව්වා, මේ අවස්ථාවේ දී, පොදු ජනතාව ගේ කැමැත්තෙන් පත් වී තිබෙන රජය, අස්ථාවරත්වයට පත් කරන්නට දරන මේ ප්‍රයත්නයට, අප උදව් නොකළ යුතු ය කියලා.

අප පැරදිලා ඉන්න එක ඇත්ත. එහෙත් අප යළිත්, බලය ලබාගන්නවා නම්, ඒ බලය ලබාගත යුත්තේ, ජනතාව ගේ ම

කැමැත්තෙත් ය. මේ විදියේ කැරැල්ලක් හේතු කරගෙන, ඒකට උදව් උපකාර කරලා, මේ දූත් පත් වෙලා තිබෙන රජය, අස්ථාවරත්වයට පත් කළොත්, ඒකෙ ප්‍රතිවිපාක අපටත් භුක්ති විඳින්ට වෙනවා. යම් දවසක අපටත්, මේ විදියේ තත්ත්වයක් ඇති වුණොත්, අප මොන විදියට ක්‍රියා කරනවාද කියල කල්පනා කර බැලිය යුතු යි. මේ එතුමා දීපු උපදේශයයි.

අප තීරණය කළා, මේ තරුණ පිරිස 1971, ඒ අවස්ථාවේ, මේ විදියේ කැරැල්ලකට යොමු වෙලා, මෙ ගෙන යන වැඩපිළිවෙළ ඒ තරුණ පිරිසටත්, ඒ තරුණ පිරිස ගේ දෙමව්පියන්ටත්, ඒ තරුණ පිරිස ජීවත් වන සමාජයටත්, සිදු වන මහත් හානියක්. ඒ නිසා අප, ඒ රජයට උදවු කළා. හදිස්සි නීතිය සම්මත කරන්න. ඒ හදිසි නීතිය අනුව, ඇඳිරි නීතිය දමා, ඒ අවස්ථාවේ දී, රට ආරක්ෂා කර ගත්තා. ඊට පස්සෙ ඒ කැරැල්ල මර්දනය වුණා ම, ඒ කැරැල්ලට මැදි වෙච්ච නායකයන් හිරබාරයට ගත්තා ම ඒ අය අධිකරණය ඉදිරියට ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ රටේ පැවති අධිකරණය ඉදිරියට නෙවෙයි, ඒ පිරිස ඉදිරිපත් කළේ.

ඒ පිරිස වෙනුවෙන්, වෙන ම නීතියක් සම්මත කළා. ක්‍රිමිනල් ජස්ටිස් කමිෂන් කියලා. පාර්ලිමේන්තුවේ දී අප ඒකට විරුද්ධ වුණා. අප කිව්වා, මේ කැරැල්ල අප අනුමත කරන්නෙ නෑ. නමුත් රටේ පවතින නීතිය තුළින්, තිබෙන අධිකරණය තුළින්, මේ ගැන විභාග කරන්නට ඕනෑ. මේ වෙනුවෙන්, අලුත් නීති රීති ගේන එක, වෙන ම උසාවි ඇති කරන එක, එහෙනම් ද්වේෂයෙන් කරන දෙයක්. ද්වේෂ සහගත ව ක්‍රියාකිරීමෙන් සත්‍යය හොයාගන්නට අමාරු යි. ඒ නිසා අපි ඒ විශේෂ අධිකරණයට, ක්‍රිමිනල් ජස්ටිස් කොමිෂන් කියන ඒ වැඩ පිළිවෙළට, අප එකඟ වුණේ නෑ.

නඩු විභාගය ආරම්භ වුණා. ඒ වෙලාවේ නඩු විභාගය බලන්නට, යන කවුරුත් අවසරයක් ගන්නට ඕනෑ. අධිකරණ අමාත්‍යාංශයෙන්, මා අවසර පත්‍රයක් ඉල්ලුවා. බොහොම අමාරුවෙන් තමයි, අවසර පත්‍රය මට දුන්නෙ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ව හිටපු නිසා, මට පුළුවන් වුණා, ලබාගන්න. නැත්තම් ඉඩ දුන්නේ, චෝදිතයන් හට, විත්තිකරුවන් ගේ ළඟ ම නෑයන් ආදී ස්වල්ප දෙනකුට පමණ යි. මා එ ද ඒ අධිකරණයට දිනපතා ම ගියා. එ ද හිටපු නීතිපතිතුමා තමයි, විශේෂ නඩුකාර මංඩලයක් ඉදිරියේ පැමිණිල්ල ඉදිරිපත් කළේ.



3—

මේ කැරැල්ලේ නායකයත් හිරකුඩුවේ හිටියා. මේ කැරැල්ලට අදාළ කරුණු ඉදිරිපත් කළා. නඩු විභාගය පැවැත්තුණා. ඊට පස්සෙ තීන්දුවකුත් දුන්නා. බොහෝ දෙනකු ජීවිතාන්තය දක්වා හිරේට නියම කැරුණා.

## 1977 මැතිවරණයෙන් පසු

ඊළඟට 1977 දී ඊට අවුරුදු හයකට පස්සෙ, පවත්වපු මහ මැතිවරණයෙත්, අප ජයග්‍රහණය කළා. අප ආංඩුවක් පිහිටෙව්වා. අපේ කැබිනට් මංඩලය එ ද නායකත්වයට පත් වුණ. ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා ගේ නිර්දේශය අනුව, අප තීරණයක් ගත්තා. මේ නඩු විභාගය පවත්වපු ආකාරය ද්වේෂ සහගත නිසා, මේ දඬුවම විඳින අය, අප නිදහස් කරන්න ඕනැ ය කියලා.

නිදහස් කළා පමණක් නො වෙයි, මෙයට සම්බන්ධ ව හිටපු විත්තිකරුවන් ඒ හිරභාරයට ගන්න වෙලාවෙ, යම්කිසි රැකියාවෙක හිටියා නම්, රජයේ දෙපාර්තමේන්තුවල නැවතත් ඒ රැකියාවල් දෙන්නටත් ඕනැයි කියලා අප තීරණය කළා. නහනම් කරලා තිබුණ ජනතා විමුක්ති පෙරමුණේ එ ද නායකත්වය දැරුවෙ රෝහණ විජේවීර මහත්මයා. එතුමා ඇතුළු ඒ පිරිස නිදහස් වුණා ම, අප ඒ පිරිසට කිව්වා, ''සහෝදරය, හැංගිලා සංවිධාන ඇති කරන්නට වුවමනා නැහැ, රහස් පංති පවත්වන්නට වුවමනාවක් නැහැ. හිංසාව කරපින්නාගන්නට වුවමනාවක් නැහැ. කරුණා කරලා තමන් පිළිගන්න දර්ශනය, ප්‍රතිපත්තිය, ජනතාවට අවබෝධ කරලා, ඒ මඟින් තමන් බලාපොරොත්තු වන, සේවය කරන්න'' කියලා. ඒ අනුව, ඒ සංවිධානය නැවතත් පිළිගෙන, මැතිවරණවලටත් සහභාගි වුණා.

## 1983 භීෂණ තත්ත්වය

1983 දී, උතුරු නැඟෙනහිර තත්ත්වය උඩ, රටේ භයානක තත්ත්වයක් ඇති වුණා. ඒ වෙලාවෙදි චෝදනා එල්ල කැරුණා, ජනතා විමුක්ති පෙරමුණට. ඒ අවස්ථාවේ නමයි, ජනතා විමුක්ති පෙරමුණ, කැලයට ගියේ. සැඟවුණේ. ඉදිරියට ආවෙ නැහැ. මට පෞද්ගලික ව පුදුමයක් ඇති වුණා, ඇයි මෙහෙම කළේ ? ඇයි ඉදිරිපත් වෙලා, ඒ කරුණුවලට පිළිතුරු නුදුන්නෙ ? නවත් ප්‍රතිපක්ෂ

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

නායකයන් කීප දෙනකු සැඟවී සිටියා. පාර්ලිමේන්තුවේ දී අප කීප විටක් කිව්වා, ''සැඟවෙන්නට වුවමනාවක් නැහැ, ඕනෑ නම් නීතිඥයන් ගේ මාර්ගයෙන් ඉදිරිපත් වෙන්න'' කියල.

එහෙම ඉදිරිපත් වුණා කීප දෙනකු. ඔවුන් ගේ කට උත්තර ගත්තා. නැවතත් ඔවුන් නිදහස් වුණා. ඔවුන් ගේ සාමාන්‍ය දේශපාලන කටයුතු කරගෙන යන්නට පුළුවන්කම ලැබුණා. එහෙත් ජනතා විමුක්ති පෙරමුණ, එළියට ආවෙ නැහැ. එහෙම එළියට නේන්නට, නේන්නට, සැකය වැඩි වුණා. මෙගොල්ලනුත් අර, උතුරු–නැගෙනහිර ප්‍රදේශයේ හමුදා භටයන්ට වෙච්ච, විපත්තිය උඩ, වෙනත් පළාත්වල අහිංසක ජනතාවට හිරි හැර – කරදර කරන්නට, සම්බන්ධ වුණා ද කියන සැකය, පැතිරී ගියා.

මෙගොල්ලන් දැන් රහසේ සංවිධානය කරන්නට පටන් ගත්තා. ආයාචනා ගණනාවක් ම ඉදිරිපත් වුණා. නමුත් ටිකෙන්–ටික නැවතත් ජනතා විමුක්ති පෙරමුණ, ත්‍රස්තවාදී වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කරන්නට පටන් ගත්තා. ඒ ඉතිහාසය නුඹලා දන්නවා. අවසානයේ දී අපේ තරුණ–තරුණියන් මංමුළා කරගෙන, ඔවුන්ට අවි–ආයුධ පුහුණුව දීලා, කණ්ඩායමක් ඔත්තුකරුවන් හැටියටත්, කණ්ඩායමක් තුවක්කු කරුවන් හැටියටත්, යොදාගෙන, තමන්ට විරුද්ධ යි කියලා හිතන උදවිය මරාදැමීමේ මහා භයානක තිරශ්චීන වැඩ පිළිවෙළකට යොමු වුණා. හේතුව වශයෙන් කිව්වෙ, අප ඉදිරිපත් වුණොත්, අප විනාශ කරයි. ඒ නිසා තමයි, අප මේ වැඩ පිළිවෙළ ගෙනයන්නෙ.

ඇත්ත වශයෙන් ම මා එදා, අගමැති හැටියට, විශේෂ උත්සාහයක් ගත්තා, අවස්ථාවක් ලබාදෙන්නට, ජනතා විමුක්ති පෙරමුණට මේ තත්ත්වයෙන් මිදෙන්නට. මා පෞද්ගලික ව ම ඇප වුණා, එහෙම ඉදිරිපත් වෙනවා නම්, සාධාරණය ඉටු කරවාදෙන්නට. මොකද මගේ හිතෙත්, එක්තරා ප්‍රමාණයෙක, හැඟීමක් තිබුණා, මේ ජනතා විමුක්ති පෙරමුණට, කිසියම අසාධාරණයක් නිසා වෙන්නට ඕනෑ, මේ විදියේ වැඩ පිළිවෙළක් ගෙනයන්නෙ. නුඹලා දන්නවා, මා පුළුවන් තරම උත්සාහ කළා. ඒ පදනම උඩ, කොහොම හරි කරලා, මේ සැඟවී සිටින ජනතා විමුක්ති පෙරමුණ, ඉදිරියට ගෙනල්ලා, ඔවුන්ට ආරක්ෂාවත් දීලා ඔවුන් ගේ අදහස් – උදහස් දැනගෙන, යම්කිසි

අසාධාරණයක් වී තිබෙනවා නම්, ඒවා සාධාරණත්වයකට පත්කර ගන්න. එහෙත් තත්ත්වය තවත් භයානක වුණා. තුංඩු කැබැල්ලෙකින් මුළු රට ම වසාදමන තත්ත්වයට භීෂණය ව්‍යාප්ත කළා. ඔවැනි අවස්ථාවෙක තමයි, ජනාධිපතිවරණය ආවෙ. මේ තත්ත්වය යටතෙ කොහොම ද මැතිවරණයක් පවත්වන්නෙ ? එහෙත් නො පවත්වා බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, මොන තරම බරපතල තත්ත්වයක් ඇති වුණත්, 1989 ජනවාරි 02 දට ඉස්සෙල්ලා, අලුත් ජනාධිපතිවරයකු පත් විය යුතු ම යි. ඉන්න ජනාධිපතිට ඉන් එහාට යන්ට බැහැ. මේක දඩමීමා කරගෙන, ජනාධිපතිවරණයට එන පක්ෂත් විනාශ කරනවා. අපේක්ෂකයනුත් මරා දමනවා කියන තර්ජන එල්ල වුණා.

**1989 ජනාධිපතිවරණය**

නමුත්තාත්සේලා දන්නවා, එක්සත් ජාතික පක්ෂයෙන් මා ඉදිරිපත් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් සිරිමා බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් කළා. ශ්‍රී ලංකා මහජන පක්ෂයෙන් ඔසී අබේගුණසේකර මහතා ඉදිරිපත් කළා. මේ කණ්ඩායම් තුනට ම ඊට උදව් කරන හැම කණ්ඩායමකට ම තර්ජන එල්ල වුණා. නාම යෝජනා දෙන්නට ඉඩ දෙන්නෙත් නැහැ කිව්වා. මේ මැතිවරණය පවත්වන්න ඉඩ දෙන්නෙත් නැහැ යි කිව්වා.

එහෙත්, කොහොම වුණත්, ඒ ජනාධිපතිවරණය පැවැත්වුවේ භීෂණය තුළින්. භීෂණය තුළින් මේ පක්ෂවල විශාල පිරිසක් අමු - අමුවේ මරා දමනු ලැබුවා. එ වැනි තත්ත්වයෙක දී, මේ රටේ ජනතාව බුද්ධිමත් ව, කල්පනා කළා, මේ භයානක තත්ත්වය තුළ දීත්, ජනාධිපතිවරණයට සහභාගි වෙලා, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරගත්ත. එතකොට මා පත් වුණා, 1989 ජනවාරි මාසෙ දෙවෙනි ද, ශ්‍රී දන්තධාතුන් වහන්සේ වැඩවසන දළදා මන්දිරයේ පත්තිරිප්පුවේ ඉඳලා, දිවුරුම දීලා.

**සාමය - සංවරය - සමෘද්ධිය**

මගේ ප්‍රතිපදාව වුණේ මොකක් ද ? සාමය - සංවරය, සමෘද්ධිය. මා පත් වෙලා දින එකොළහක් ඇතුළත, මා මොකක්ද කළේ. හදිසි නීතිය ඉවත් කළා. ඒ වෙලාව වෙන කොටත්, ත්‍රස්තවාදී වැඩවලට සම්බන්ධ

වූ. 1800 ක් තරුණයත්. හිරගෙවල රඳවාගෙන හිටියා. මා කිව්වා. ඔක්කොම හිර ගෙවල් දොරවල් අරින්නෙයි කියලා. ඒ එක් දහස් අට සිය ම යැව්වා. මෙච්චර අපරාධ කරල තිබෙන. ජනතා විමුක්ති පෙරමුණේ නායකයන්ට මං ආරාධනා කළා, ආයාචනා කළා, ''අතීතය අමතක කරන්න. දැන් නව රජයක් ඇති වෙන්නට යන්නෙ. මා ජනතාව පත් කරලා තිබෙනවා. මා ආවේ. සාමය. සංවරය. සමෘද්ධිය සඳහා'' කියලා.

ඔන්න හදිසි නීතිය ඉවත් කළා. හිරබාරයේ හිටපු එක් දහස් අට සියකුත් නිදහස් කළා. නොයෙක් අය මට බොහෝ දෙස් කිව්වා. මෙ නිදහස් කරනු ලබන්නෝ කවුරුද ? මිනීමරුවෝ නේද ? මා කිව්වා නැහැ. අපි උත්සාහ කරලා බලමු. සාමයක් ඇතිකරන්න. අපේ තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේ ගේ, ආදර්ශය අපි අහලා තියෙනවා. උන් වහන්සේ කොයි වෙලාවක වත්. කොයි තරම වරදක් කළ පුද්ගලයකු කෙරෙහි වත් ද්වේෂයක් ඇති කරගත්තෙ නැහැ. ඒ ක්‍රියාව ගැන තමයි. උන් වහන්සේ කරුණු ඉදිරිපත් කළේ. පුද්ගලයා ගැන නො වෙයි.

### චිත්ත දමනය

ඇයි එහෙම කල්පනා කළේ. ඇයි ඒ විදියට උන් වහන්සේ ඉගැන්නුවේ. මෙ ක්‍රියාවල යෙදෙන්නේ. ශරීරයට කලින්, එයා ගේ හිත. හිතේ තමයි මෙ භයානක තත්ත්වය ඇති වෙන්නෙ. ඒ හිතේ ඇති වන ඒ වැරදි කල්පනාව මරාදමන්නට ඕනැ. එහෙම නැතුව ඒ වැරදි කල්පනාව උඩ, ක්‍රියාත්මක වන ශරීරය විනාශ කිරීම, ඵලදායක දෙයක් නෙවෙයි. මෙ හිතේ පහළ වෙලා තමයි, හොඳක් හෝ නරකක් කරන්නෙ ? මෙ නරකට යොමු වුණු තැනැත්තාට, දඬුවමක් දෙනවා නම්, ඒ දඬුවම දෙන්නට ඕනැ, ශරීරයට නෙවෙයි, එයා ගේ හිතේ ඇති වෙච්ච සිතුවිල්ලට යි. සිතුවිල්ලට දිය හැකි ලොකු ම දඬුවම තමයි, ඒ වැනි සිතුවිලි අස් කරවීම. නැත්නම් ඒ සිතුවිලි මැරීම.

ඒ සිතිවිලි ඇති කරගත්ත පුද්ගලයා මරාදැමීමෙන්, දඬුවම් කිරීමෙන්, කවර ද වත් ඒ සිතිවිල්ල නැති වෙන්නෙ නැහැ. ඒ සිතිවිල්ල එ සේ ම ගමන් කරයි. මෙන්න මෙ විදියේ අනුශාසනා ලබා තිබෙන නිසයි මා ඒ විදියට ආරාධනා කළේ. ආයාචනා කළේ.

මට ලියමනක් එවලා තිබුණා. රෝහණ විජේවීර මහතා. ''තමුන්නාන්සේ ගේ ආයාචනය, නාම පිළිගන්න පුළුවන් කියලා අප හිතන්නෙ නැහැ. ඒ ගැන බොහො ම කනගාටු යි කියලා''. එහෙත් මා දිගට ම ඒ ආයාචනය කළා. මාස ගණනාවක්ම. ඒ අතරත්, මිනීමැරුම් දිගට ම කෙරෙනවා. ප්‍රචණ්ඩ ක්‍රියා දිගටම කෙරෙනවා. පොදු දේපළ දිගට ම විනාශ කරගෙන යනවා. මගේ ආයාචනය මා නවත්වන්නෙ ම නැහැ.

**භීෂණය මර්දනය හා පුනරුත්ථාපන වැඩ පිළිවෙළ**

එහෙත් එය ඉතා උත්සන්න තත්ත්වයකට ආවා. බොහෝ කණ්ඩායම්, බොහෝ ජනතාව මට කිව්වා, මොනවද මේ කරන්නෙ ? තමුන්නාන්සේ ආරාධනා කරනවා. අර පැත්තෙන් තුවක්කුවෙන් පිළිතුරු දෙනවා, මොනවද මේ කරන්නෙ ? වහා ම හදිසි නීතිය පනවලා, ත්‍රිවිධ හමුදාවටත්, පොලීසියටත් භාර දෙන්න, මේ රට ආරක්ෂා කරන්න. පින්වතුනි, නැවතත් හදිසි නීතිය යෙදුවා. ඒ අනුව, ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත් ක්‍රියාත්මක වුණා. ඒ ඉතිහාසය තමුන්නාන්සේලා දන්නවා. ඒ අනුව තමයි, ඒ භීෂණය මර්දනය කරන්නට පුළුවන් වුණේ. ඒ අවස්ථාවේ අප අවකාශ දුන්නා, සමහරුන්ට භාර වෙන්නට. සමහරුන් අල්ලාගත්තා. මීළඟට කල්පනා කළා, කොහොම හරි කරලා, මේ උදවිය ගේ හිතේ ඇති වෙච්ච මේ ඔළාරික ගතිය, වැරදි සිතුවිලි, ඉවත් කරවා යහමගට යොමු කරගැනීම සුදුසුයි කියා. ඒ අනුව තමයි, මේ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ ආරම්භ කළේ. අපට පෙනුණා බ්‍රිගේඩියර් ආනන්ද වීරසේකර මැතිතුමා තුළ, අර අපේ සංකල්පය තියෙන බව. එතුමා ඇතුළු හොඳ නිලධාරි පිරිසකට, අපි මේ කාර්යය භාරදුන්නා.

එතුමා දැන් තමුන්නාන්සේලාට විස්තර ඉදිරිපත් කළා. කො පමණ මුදල් සම්භාරයක් මේ වෙනුවෙන් යොදවනවා ද ? කොයි තරම් උත්සාහයක් දරනවා ද ? අපේ විහාරස්ථාන පවා, අපි මේ වැඩ පිළිවෙළට සම්බන්ධ කරගත්තා. හොඳ ප්‍රතිඵල තියෙනවා. මම කැමති යි, නිතර ම, ඒ හොඳ ප්‍රතිඵල දෙස බලන්න. කොයි තරම් කිව්වත්, කොයි තරම් උත්සාහ කළත්, සුමඟට යොමු කරගැනීමට, බැරි උදවිය නැතිවා නොවෙයි. ඒක ඒගොල්ලන් ගෙ අවාසනාවකට වඩා, අපේ දුර්වලකම වෙන්නට පුළුවන්. අප තව - තවත් දැනුවත් වෙන්ට ඕනැ. පුළුවන් තරම් හිත් හදන්නට.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

හිතේ තමයි, මෙක ඇති වෙන්නෙ. එහෙත් එහෙම හිත හදගත් තරුණ පිරිස, අද වැඩදායක කාර්යයන්හි යෙදී ඉන්නවා. එතුමා ඒ සංඛ්‍යාලේඛණ ඉදිරිපත් කළා. මා හමු වෙලා තිබෙනවා, මහාදරුණු, භයානක දේ කරපු තරුණ පිරිස, මා හුඟක් සාකච්ජා කළා. මා සාකච්ජා කරපු ඇතැම් කෙනකු දහ – දෙළොස් දෙනකු මරාදපු අය.

**තරුණයනට ආයාචනා**

වෙනත් අපරාධ කරපු, එක්කෝ හිරබාරයට ගත්ත: නැත්නම්, බාරවුණ උදවිය එක්ක මා කථාකරල තියෙනවා. එක්කෙනකු මට හම්බවුණා ගිරාදුරුකෝට්ටෙ දි, ගිරාදුරුකෝට්ටෙ යොවුන් පුරය පවත්වපු වෙලාවෙ, මම මේ විදියෙම ආයාචනයක් කළා. අපේ තරුණයන්ට. කරුණාකරලා, මේ වැරදි මාර්ගයෙන් ඉවත් වෙලා, එන්න කියලා. මා දන්නෙත් නෑ, එද ඒ කතාව රූපවාහිනියෙත්, සජීවී ලෙස ප්‍රචාරය වෙලා තියෙනවා. අපට එක තරුණයකු කිව්වා, මෙහෙම :

''හතර වැනි එක්කෙනා මරන්නට, මට තියම කරලා, මා ගෙනල්ලා, කුරුණෑගල බස්නැවතුම් පළේ බැස්සුවා. ඒ වෙන කොට තුන් දෙනකු ම මරලා ඉවර යි. මට එ ද අණක් ලැබුණා, එ ද හවසට එනවා, මා එක්ක යන්න. මේ බස්නැවතුම් පළේ ම ඉන්න. අහවල් තැන ඉන්න ය, කියලා මගේ සාක්කුවට දහකුත් දැම්මා. තියමයක් කෙරුණා පක්ෂයෙන්, එ ද තවත් කෙනකු මරා දමන්ට තිබෙනවා කියල.''

ඉතින් මේ පුද්ගලයා හෝටලයෙකින් කෑම කාලා එහාට මෙහාට ඇවිදගෙන එන කොට, එක හෝටලයක රූපවාහිනියේ පේනවා, මහියංගණයේ ගිරාදුරුකෝට්ටේ, යොවුන්පුරයේ වැඩසටහන යනවා. එනකොට මා කථා කරන ආකාරය දැක්කා. ඒකෙදී මා කරපු ආයාචනය, අහගෙන හිටියා. බලන් හිටියා. දහස් සංඛ්‍යාත තරුණ පිරිසක් ''මා වගේම තරුණයන්, යොවුන් පුරයේ ඒ කථාවට ඇහුම්කන් දෙනවා, බලන් ඉන්න කොට ම, මගේ හිතේ මොකක්ද වෙනස් වීමක් ඇති වුණා'' කියලා කිව්වා.

මට පුදුම යි, මෙයා කියනවා මට. ''දැන් මා තුන් දෙනකු මරලා ඉන්නෙ? පළමු එක්කෙනාට වෙඩි තියන කොට විතරක් අත වෙව්ලුවා. ඊට පස්සේ ඒක තිකම සෙල්ලමක් බවට පත් වුණා. මට ඒක තිකම කුඹියකු පාගලා දානවා වගේ වැඩක් බවට පත් වුණා. නමුත් මට පුදුම යි, අර දහස් සංඛ්‍යාත තරුණ පිරිස දැක්කම, මාත් ඒවගේ කෙනෙක් නේද ? ඇයි මට බැරි ඒ තත්ත්වයට යන්න. මට

මොකක්ද මේ වුණේ. හිතේ පුදුම විදියෙ වෙනසක් මගෙ හිතේ ඇති වුණා. මා මොකද කළේ''. මෙයා මට කියනවා. ''එක් වර ම ගියා. බස්රථයකට නැංගා. කෙළින් ම ගිහිල්ලා භාර වුණා''. මේ හතර වැනියා මරන්න ගිය එක්කෙනා.

මා මේ සිද්ධිය කිව්වේ. හිත වෙනස් වෙනවා කියන එකට. වැඩි වෙලා යන්නෙ නැහැ. හිතෙන් හිතලා තමයි. මරන්නෙ. හිතෙන් හිතලා තමයි. කෙනකුට උදව් වෙන්නෙ. ඒ හිතේ ඇති වන සිතිවිල්ල. තව එක කාරණයක් නමුත්නාත්සේලාට කියන්නම්. මා ආයාචනය කළා හැම තිස්සෙ ම. ඇහුවෙ නැහැ. ඊළඟට හදිසි නීතිය දමාලා මේ තත්ත්වය මර්දනය කළා.

එ ද ගිරාදුරුකෝට්ටෙ කථාවෙ දි මා කිව්වා ජනතා විමුක්ති පෙරමුණට '' භයක් තියෙනවා නම් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් හැටියට පත් කරන්නම්. අපේ ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරුන්ට ඉල්ලා අස්වෙන්නට කියලා, මං නමුත්නාත්සේලා ගේ නායකයන් දන්නම් පාර්ලිමේන්තුවට. එතකොට වරප්‍රසාදත් තියෙනවා. භය වෙන්නට දේකුත් නැහැ. සාකච්ඡා කරන්නට පුළුවන්. නමුත්නාත්සේලාට අසාධාරණයක් වෙලා තියෙනවා නම්, මං ඒවා සාධාරණයට පත් කරනවා. මා ගැන සැකයක් හිතන්නට එපා. මම නමුත්නාත්සේලා වෙනුවෙන් කථා කළ කෙනෙක්''කියලා.

මේ ආයාචනා කිසිවක් භාර ගත්තෙ නෑ එන්නට – එන්නට ම තත්ත්වය දරුණු වුණා. ආයිමත් හදිසි නීතිය නැතුව, ත්‍රිවිධ හමුදාවටත්, පොලිසියටත්, රාජකාරි කරන්නට බැහැ. අන්න ඒකයි වුණේ. ඉතින් දූත් ඒ ගමන් මඟ අත්ඇරලා, අලුත් ජීවිතයකට පත් වෙන්නට සූදානම් හැම කෙනකුට ම, අප අවස්ථාව දී තියෙනවා. මා දන්නවා, ඇතැම් විටෙක නිදහස් වෙලා යන අයට, කරදර ඇති වෙලා තිබෙන බව. අපට තොරතුරු ලැබෙනවා. සමහර තැන්වල, දරුපවුල් පිටින් මරාදපු අය. නිදහස් වෙලා ඇවිල්ලා ඉන්නවා ය කියලා දැන ගත්තම, ඇතැම් උදවිය මේ යථා තත්ත්වය නො දැන ඒ අයටත් හිරිහැර කරනවා ඇති. ඒ නිසයි. අප තවමත් රඳවාගෙන ඉන්නෙ ඇතැම් අයට ආරක්ෂාව පිණිස. දහස් සංඛ්‍යාත මව්වරුන්, දෙමව්පියන්, තැදෑයන් තවමත් ඇඬූ කඳුළෙන් ඉන්නෙ. ජේ.වී.පී. භීෂණය නිසයි.

විශ්වාස කරන්න, ජනාධිපතිවරණයේ දී මා එක්තරා ප්‍රදේශයෙක රැස්වීමකට යා යුතු ව තිබුණා. ඒට පසු ද උදේ 9.00 ට. අද රාත්‍රියේ, මට පණිවිඩයක් එවනවා. '' හෙට රැස්වීම තියන්නට බෑ. පොලීසියෙත් කියනවා. හෙට උදේ රැස්වීම තියන්නට බැරි වෙයි. ඇයි ? ඒ රැස්වීමේ, මූලිකත්වය ගෙන ක්‍රියාකරපු. උදවිය ගේ ගෙදර ඉන්න තව දෙනා ම දූන් පැය භාගයකට ඉස්සෙල්ලා වෙඩි තියලා මරලා දැම්මා. ඒ ගෙවල් කිට්ටුව ම යි. මේ රැස්වීම තියන්නට යන්නෙ. ඒනිසා හෙට රැස්වීම තියන්නට බැරි ය '' කියා. මා කිව්වා කොහොම ද එහෙනම් රැස්වීමක් පවත්වන්නෙ. මට බොහොම කනගාටුයි. මේ වෙච්ච දේට. පැයක් ඇතුළත එනවා. ඒ අතර ඒ ගෙදර උදවිය ගෙ කිට්ටුවන්න ඥාතිවරයකු ටෙලිෆෝන් කරලා කියනවා. '' ජනසම්මතවාදය ආරක්ෂා කරන්ට යි. අපි තමුන්නාන්සේ වෙනුවෙන් මහන්සි වෙන්නෙ. මේ ජනාධිපතිවරණය පැවැත්තුවෙ නැත්තම් මේ රට විනාශ වෙනවා. තමුන්නාන්සේ ගැන විශ්වාසයක් තිබෙන නිසයි. අප මහන්සිවෙන්නෙ. නමුත් අපේ ඥාතිවරුන් තව දෙනකු දූන් ස්වල්ප වේලාවකට ඉස්සෙල්ලා මරා දැම්මා. අපේ අනිත් ඥාතිවරුන් සාකච්ඡා කළා. මොකද කරන්නෙ හෙට රැස්වීමට. අපේ තීරණය මෙකයි අපේ ඥාතිවරු ජීවිතය දුන්නෙ ජනසම්මත වාදය වෙනුවෙන්. අපට ලොකු පාඩුවක් වුණේ. ඒ උදවිය ගේ මරණයෙන්. අප තවත් පාඩුවක් විඳිනවද ජනසම්මත වාදය නැති කරගෙන. නැහැ. එන්න. මළකඳන් ගෙදර තියෙද්දි, අප මේ රැස්වීම සංවිධානය කරනවා. විශාල පිරිසක් ඒවි. කරුණාකරල එන්න ''. විශ්වාස කරන්න, මා ගියා. මට පුදුමයි. දහදහකට වැඩිය ජනකායක්. එක් රොක් වුණා. ඒ රැස්වීමට.

### භීෂණයට හේතු ඉවත් කිරීම

බලන්න කල්පනා කරලා, මොනවිදියට අපේ රටේ, ජනතාව කල්පනා කරනවද ? මේ රටේ වැඩි දෙනෙක්, ඉතා උසස් ගුණ සමුදායන්ගෙන් යුක්ත අය. තමන් ගෙ ජීවිතවලට වඩා, සාරධර්ම අගේ කොට සලකන අය. එහෙව් සමාජයෙක අප ජීවත් වෙන්නෙ. අපේ තරුණ පිරිස මුළා කළා යම් යම් කරුණු උඩ. අද අප මොකද කරන්නෙ ? අප උත්සාහ කරන්නෙ. අපේ තරුණ පිරිස මුළා කරන්නට හේතු භූත වෙච්ච කරුණු තිබෙනවා නම්, ඒවා විමසා බලා. ඒ හේතූන් ඉවත් කිරීමට අපට පෙනුණා. රැකී රක්ෂා දීමේ දී

කුසලතාවට වඩා. තැදෑ හිතවත්කම්වලට. දේශපාලන පක්ෂපාතිත්වයට තැන ලැබුණ බව. ඒක අසාධාරණ යි. එ වැනි අසාධාරණ කම් කියලා තමයි. අපේ ගම් දනව්වල තරුණයන් කැලෑවට එක්ක ගියේ. එක තරුණයකු මට කිව්වා. '' ජනාධිපතිතුමනි. මා උසස් පෙළ විභාගය සම්මාන හතරක් ඇතිව ඉන්නෙ. මා වාගේ ම අපේ ප්‍රදේශයේ තරුණ – තරුණියන් දෙලොස් දෙනකු. මේ සුදුසුකම ලබාගන හිටියා. එහෙත් රැකියාවල් දීමේ දී මොකක්ද කැරුණෙ ? පවුල් තුනක අට දෙනකුට පමණක්. මේ රැකියාවල් ලැබුණා. අප ඔක්කොම ගැන කල්පනා කරලා. අඩු ගානේ එක පවුලෙකින් එක් කෙනකු වත් ගත්තා නම්. ඒකෙ සාධාරණයක් තියෙනවා '' කියලා.

පවුල් තුනකට අයිති තැදෑ සම්බන්ධකම් නිසා. අට දෙනකුට ම රක්ෂාව ලැබුණා. අප මේක ගිහිල්ලා කිව්වා. මෙක වැරදි යි. ඒක අසාධාරණ යි. ඉතින් මේකේ ප්‍රතිරාවය විවිධ යි. අසහනයට හේතුවක් වෙනවා. එහෙම අසහනයක් ඇති වුණා ම. ඒක පිට කරගන්නට. මාර්ගයක් හොයනවා. ඒ වෙලාවට මේ තරුණ පිරිස බිළිබාගෙන තොමහ යවන්නට බලාගෙන ඉන්න. ජනතා විමුක්ති පෙරමුණ වැනි ආයතන. සංවිධාන ප්‍රයෝජනය ගන්නවා. ඒගොල්ලන්ට සර්වජන ඡන්ද බලයෙන්. ජනතාව ගේ විශ්වාසය දිනාගන්නට බැරි නිසා. චණ්ඩි බලයෙන්. දමරික බලයෙන්. භීෂණයේ බලයෙන්. තුවක්කුවේ බලයෙන්. බෝම්බෙ බලයෙන්. වෙඩි උණ්ඩෙ බලයෙන්. ජයග්‍රහණයක් ලබාගෙන. ඒකාධිපති පාලනයක් ඇතිකර ගන්ට මේ අසහනයන් ප්‍රයෝජනයට අරගෙන තමන්ගෙ කණ්ඩායම වැඩිකර ගන්නට පටන් ගන්නා.

**ජන අනුපාතය අනුව**

ඒවා අප තේරුම් ඇරගෙන. ඒව වෙනස් කරගෙන යනවා. දැන් ජන අනුපාතය අනුව දෙන්නේ රැකියාවල්. මේ රටේ. සිංහල. දෙමළ. මුස්ලිම්. බර්ගර් කියන ජන කොටස් ඉන්නවා. ඒ අනුව. රැකියාවල් දෙනවා. ගෙවල් දීම. ඉඩම් දීම. කෙරෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ ආඥා පනත යටතේ සාධාරණ ලෙස ඉඩම් දීල තියෙනවද කියල බලන්න. මා කමිටුවක් පත්කළා. ඒ කමිටුව කිව්වා. ඇතැම් තැන්වල මහා අසාධාරණ කම් වෙලා තියෙනවා. දැන් නීති – රීති වෙනස් කරගෙන යනවා. ඒ ඉඩම් ලබාගන්න අයට. ඒ ඉඩම් ස්ථිර වෙන්නෙ ඊට පස්සෙ. ඒගොල්ලන් ඔප්පු කරන්නට ඕන තමන් ගෙ සුදුසුකම්.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ඇතැම් තැනෙක මහා වට්නා ඉඩම. ඉතා සුළු මුදල්වලට අරන් තියෙනවා. ඒවට කිසි සාධාරණයක් නැහැ. ඒවාට කට උත්තර බඳින්නට ඔනෑ. ඒ විදියට අසහනයට හේතු වෙච්ච දේවල්, අප ඉවත් කරගෙන යනවා.

**විදෙස් හමුද**

උතුරෙත් – නැගෙනහිරත්, ඇති වෙච්ච තත්ත්වය අනුව, විදේශීය හමුදවක් ආවා අපේ රටට. ඉන්දියන් හමුදව ආවා. එනකොට ජනතා විමුක්ති පෙරමුණ මොකද කිව්වෙ. '' අයි. පී. කේ. එෆ් ඉන්දියානු හමුදව. විදේශීය හමුදවක්. ඒක පන්නන්න යි, අප මේ පහර දෙන්නෙ. '' මා ඇහුවා. ඒගොල්ලො පන්නන්න මොකට ද මෙහෙ ඉන්න මිනිස්සුන්ට ගහන්නෙ. මේ ගම්දනව්වල ඉන්න අහිංසක අය මරන්නෙ මොකට ද ? ඉන්දියානු හමුදව පන්නන්න. ඒගොල්ලො ඉන්නෙ උතුරු – නැගෙනහිර පළාත්වල. හොඳයි කොයි එක වුණත් මා පත් වුණාට පස්සෙ, අවුලක් කරගත්තෙ නැතුව, කට්න් ම කියලා යාන්තම ඒ හමුදව ඉන්දියාවට ආපහු ඇරියා.

ඉන්දියාවෙ ජනතාව අපට ඒකට උදව් වුණා. අලුත් ආණ්ඩුවක් පිහිටුවා ඒ උදව්ය අපට උදව් වුණා. විපීසිං අගමැතිතුමා පත් වුණා ම, තමුන්නාන්සේලා ගේ ම වාසනාවට අපට පුළුවන් වුණා, ඒ විදේශීය හමුදව පිට මං කරන්න. එහෙම පිට මං කළා කියලා ජනතා විමුක්ති පෙරමුණ ප්‍රශංසා කළා ද ? තමන් ගේ භීෂණය නැවැත්තුවා ද ? නැහැ. තාමත් උත්සාහ කරනවා එහෙත් – මෙහෙත් – හොරෙන්. ඇතැම් තැනෙක මේ භීෂණය ආයිමත් ඇති කරන්න. නොයෙක් මාර්ගවලින් උත්සාහ කරනවා. මේ ඉදිරිපත් කළේ අවංක ව ම ද මේ කාරණාව. එහෙනම් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රසාදය ලැබෙන්නට එපා යැ . . . . '' ආ . . බොහොම හොඳ යි. දැන් කුසලතාව අනුව පත්වීම දෙන්නෙ. සාධාරණය ඉෂ්ට වෙනවා. අයි.පී.කේ.එෆ් එකත් යැව්ව '' යි කියල.

දැන් මේක අධම්මා කරගෙන, ජේ.වී.පී. එකේ අවතාර වගේකුත්, ජනතාව බිය වද්දන්ට, තමන් ගෙ පෞද්ගලික කෝන්තර ඉෂ්ට කර ගන්ට, හරියට ජනතා විමුක්ති පෙරමුණෙන් පණිවිඩයක්, ලියමනක්, තර්ජනයක් එවනවා වගේ ලියුම් ලියනවා. ඒගොල්ලො ගැනත් රජය විමසිල්ලෙන් ඉන්නෙ. මට ඕන කළේ තමුන්නාන්සේලාට ඒක කියන්න. අද පුනරුත්ථාපනය ලබන අපේ තරුණ පිරිස, දැන් දැඩි ලෙස

කල්පනා කරන්ට ඕනෑ. ඇයි අපේ හිතට මෙ වැනි. තපුරු – නරක සිතුවිලි ආවෙ. අප වැඩිය මේව ගැන නොහිතපු නිසා. ඒට අවස්ථාවක් දූන්. නමුත්තාත්සේලාට ලැබිලා තිබෙනවා.

**දූනුම ගැන විමැසීම**

තමුත්තාත්සේලා කල්පනා කරන්නට ඕනෑ. උගත් තරුණ – තරුණියන් බොහෝ දෙනකුට මේ දූනුමෙන් කිසි ම පලක් නැහැ. ඒ දූනුම ගැන විමර්ශනයක්. වඩ – වඩාත් සිතන්නට උත්සාහයක් ඇති කරගන්නෙ නැත්නම්. බලන්න. තමුන්නාන්සේලා මෙ ලෝකයට ආවෙ අනින් අයට විපත්ති කරන්න ද ? නැහැ. යහපතක් කරන්න. වුණේ යහපතක් ද ? විපතක් ද ? ඒ ගැන කල්පනා කරන්න. සෙසු ජනතාව ගැනත් කල්පනා කරන්නට ඕනෑ. අප සාමයෙන් අපේ ගමවල ජීවත් වුණා. අනේ දූන් සාමය නැති වෙලා තිබෙනවා පිටින් ආපු අය නිසා. පිටින් ඇවිත් අපේ ගම් දනව්වල. මෙ නොදූමුණු ක්‍රියා කරල භීෂණය ඇති කෙරුවා. ඒනිසා තමයි. මා කල්පනා කළේ. අපේ සිද්ධස්ථාන. අපේ විද්‍යාල. අපේ පොලිස්ස්ථාන. සම්බන්ධ කරලා. මෙ ගම්දනව්වල. ආරක්ෂාව ඇති කරන්නට ඕනෑ. සාමය ඇතිකරන්නට ඕනෑ. සංවරය ඇති කරන්නට ඕනෑ. මට පේනවා එය සාර්ථක වේගන එනවා. මට ලැබී තිබෙන වාර්තා ඉතා සතුටු දයක යි. බොහෝ පළාත්වල මෙ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන පළාත්වල අපරාධ අඩුවේගන යනවා. අපරාධවලට යොමු වෙච්ච අයත්. සුමඟට යොමුවේගන එනවා.

ගමවල තරුණ – තරුණියන්. අද වෙනදට වඩා. අනික් උදවිය ගේ යහපත පිණිස ක්‍රියාකරන්නට කැප වී ගෙන උනන්දුවක් ඇතුව ක්‍රියා කරනවා. නව උසස් ප්‍රතිඵල ගලාගෙන එනවා. අප අපේ අත්දැකීම්වලින්. පාඩම් ඉගෙන ගෙන ක්‍රියාකළ යුතු ව තිබෙනවා. හැම දෙයක් ගැන ම ගැඹුරට හිතලා. මෙ හැම දේම කෙරෙන්නෙ අපේ සිතුවිලි අනුව නේද කියල කල්පනා කරල. ඒ සිතුවිලි යහ මගට යොමුකර ගන්ට අප ක්‍රියා කළ යුතු යි කියල නිතරම මතක තියාගන්න.

**හිත ගැන හිතීම**

සිල්සමාදන් වෙනව යි කියන්නේ. මෙ අටසිල් සමාදන් වීමෙන්. අපි අවකාශයක් ලබාගන්නවා. දිනපතා ජීවිතයේ කාර්යයන් ගෙන් බැහැර ව. හිත කෙරෙහි අපේ මුළු අවධානය ම යොමු කරන්න.

මනුෂ්‍යයකු ගෙ පැවැත්මට, හිතේ ක්‍රියාකාරිත්වය අත්‍යවශ්‍ය යි. එහෙත් අද නොයෙක් විද්‍යාඥයන් හොයාගෙන තිබෙනවා, එහෙව් හිත ගැන සිතීම තරම් අඩුවෙන් කරන වැඩක් මිනිසා තවත් කරන්නෙ නැහැ. මෙ විද්‍යාඥයන් කියනවා. " මේ හිත හැම කාරියකට ම මුල් වෙනව. නමුත් ඒ ගැන නො සලකා, මිනිසා ක්‍රියා කරන නිසා, වැරදි ක්‍රියාමාර්ගවලට මිනිසා යොමුවෙනවා", කියා. මෙකට අත්‍යවශ්‍ය ප්‍රතිකර්මය නම්, හිත ගැන හිතීම ය. ඒ හිත යහපතට යොමු කර ගැනීම ය කියා අද ලෝකයේ බෞද්ධ නොවන විද්‍යාඥයන් පවා ප්‍රකාශ කරනවා.

බොහෝ විට යම් යම් උදවිය කියනවා, මට හරියට වැඩ තියෙනවා, මට හරියට පොත් – පත් කියවන්න තියෙනවා. මට නොයෙක් රාජකාරි කරන්න තියෙනවා. මට හිත ගැන යොමු කරන්න වෙලාවක් නැහැයි කියා. එහෙනම් එයා කරන වැඩ ඔක්කොම එයා අවුල් කර ගන්න කෙනෙක්. කාර්යාලයක ලිපිකරුවකු වුණත්, කම්මලෙක කම්කරුවකු වුණත්, ගොවිතැනෙහි යෙදෙන ගොවියකු වුණත්, පාසලේ ඉගෙන ගන්න දරුවකු වුණත්, අවබෝධ කරගන්නට ඕනෑ, මේ තමන් කරන කාර්යයට ප්‍රධාන වෙන්නෙ තමන් ගෙ හිත යි කියා. උසස් පෙළ විභාගයෙන් එක ශිෂ්‍යයකු, විභාගයට ගන්න හැම විෂයකින් ම, සම්මාන සහිත ව, විශිෂ්ට සම්මාන සහිත ව, සමත් වුණා. මා හිතුවා මෙයා ගෙ දෙමව්පියන් හොඳට ටියුෂන් අරන් දීලා ඇති කියලා. ඉතින් මා මේ ගැන කරුණු හොයලා බැලුවා. මට දැන ගන්න ලැබුණා, ඒ ළමයා එහෙම ටියුෂන් අරගෙනත් නැහැ. ගෙදර දෙරේදී වැඩිය මහන්සි වෙලත් නැහැ. තාත්තා මේ ළමයාට කියා තියෙනවා, " ඔයා පැය දෙකක් ගෙදරදී පාඩම් කටයුතුවල යෙදුණාට කමක් නැහැ. නමුත් අඩු ගානේ පැය භාගයක් වත්, ව්‍යායාමයෙක යෙදෙන්නට ඕනෑ ; ක්‍රීඩාවෙක යෙදෙන්නට ඕනෑ ; ඒ වගේ ම මම කැමතියි, ඔයා විනාඩි 10 ක් භාවනාවේ යෙදෙනවා දකින්න " කියා.

මේ දරුවා, විෂයයන් හැම එකෙකින් ම උසස් සම්මාන සහිත ව, සමර්ථ වුණා විතරක් නෙවෙයි, මේ දරුවා කියනවා, " මට පුළුවනි අනික් කිසි දේකින් තොර ව යම් දෙයක් ගැන හිතලා ඒක ගැන පමණක් අවධානය යොමු කරන්න " කියා.

## වැරැදි තීරණ

යමක යථාර්ථය බලාගන්න, ඒකෙ නියම තත්ත්වය හොයාගන්න, හිතන්නට, මගේ තාත්තා මට පුරුදු කළා '' ය කියලා ඒ දරුවා කියනවා. ලෞකික වශයෙන් කොයි තරම ප්‍රයෝජනයක් මෙකෙන් අත් පත් වෙනවා ද ? **අප බෙහෙවින් වැරදි කරන්නෙ පින්වත්නි, වැරදි තීරණ නිසා. වැරදි තීරණ කෙරෙන්නෙ අත් දෙකෙන්, සහ වෙනත් අඟපසඟවලින් කෙරෙන්ට ඉස්සෙල්ලා හිතෙන්. ඒ හිත නිවැරැදි තීරණ ඇති කර ගන්න තත්ත්වයකට අප සංවිධාන කර ගත්තොත්, එහෙනම් අපට මෙයට වඩා, දුකින් තොර ජීවිත ගත කරන්නට පුළුවන් වෙනවා.**

## අලුත් පිටුවක් පෙරළමු

අද පනස් දෙනකු මේ පුනරුත්ථාපන වැඩ පිළිවෙළින්, සමාජයට යනවා. තවත් අය ඉන්නවා. ඒ උදවියත් කල්පනා කරන්ට ඕනෑ, '' අපේ අතීතයේ දී, අපේ අතින් නොයෙක් දේ වෙන්නට ඇති. **ඒ පරිච්ඡේදය ඉවර යි. දැන් අපි ඒවායේ අත්දැකීම් ලබාගෙන. අප ඉදිරියට ගමන් කරන්ට ඕනෑ. මට වත් අනුන්ට වත්, හිරිහැරයක්, නොවන අන්දමට මා ජීවත් වෙන්නට ඕනෑ.** මා ජීවත් වෙන්නෙ මෙ සමාජයේ, හැම දෙනා ගේ ම ආධාරයෙන්. ජීවිතයක් සාර්ථක කරන්නට කීදෙනකු උදව් කරනවා ද ? දෙමව්පියන් – නෑදෑයන්, මිත්‍රයන්, හිතවතුන් සහ අසල්වාසීන්, පමණක් නෙවෙයි මේ සමාජයේ ස්වාභාවික වස්තූන් අපට කොච්චර උදව් කරනවා ද ? '' කියල.

මේ මහා පොළොව, මේ මහා අවකාශය, මේ සූර්ය රශ්මිය, මෙ ජලය, වාතය නැති ව අපට ජීවත් වෙන්නට පුළුවන් ද ? මේ ගහ කොළත් මේ වැලි, මේවා නැතුව අපට ජීවත් වෙන්න පුළුවන් ද ? ඒ හැම දෙයක් ම, අපට උදව් උපකාර කරනවා. ඒ හැම දේක ම සංකලනයක් තමයි. 'මම' කියල කෙනෙක්, ඇති වුණේ කියන එක අප හිතන්නට ඕනෑ. අවසානයේ දී ප්‍රාණය නිරුද්ධ වුණා ම, මේ ශරීරයේ හැම කොටසක් ම, ඒ ඒ තැන්වලට ගමන් කරන බව අද විශ්වාසයක් නෙවෙයි. පර්යේෂණවලින් අවබෝධ කර ගෙන තිබෙනවා. ශරීරයේ දියර ගතිය, දියරට. තද ගතිය, පසට. වාතය, සුළඟට. රස්නය, රස්නයට. මේ ඔක්කොම, කොටස් ඒ ඒ කොටස්වලට ගමන් කරන බව තමුන්නාන්සේලා හොඳට ම දන්නවා.

එහෙනම් විශාල පිරිසක්, වස්තූන් ගණනාවක්, අපි එක් - එක්කෙනකු ගෙ ජීවිතයට උපකාර වෙනවා නම්, අප කල්පනා කරන්න ඕනෑ, අප යම් කෙනකුට, හිරිහැරයක්, කරදරයක් කලොත්, අප ජලය අපවිත්‍ර කලොත්, ගස්කොළන්වලට හානි පැමිණෙව්වොත් මේ මහ පොළව පරිසර දූෂණයට පත් කලොත්, කාට ද අප මේ වැරදි කරන්නෙ ? අපට ම යි. අපට උදව් උපකාර කරන වස්තූන් ම යි, අප විනාශ කරන්නෙ. අන්න එහෙම කල්පනා කරලා ජීවත් වෙනවා නම්, අපේ සමාජය මෙයට වඩා, වාසනාවන්ත සමාජයක් බවට පත් කර ගන්නට පුළුවන් බව ප්‍රකාශ කරමින් මගේ කථාව මෙතෙකින් සමාප්ත කරනවා.

**1991.03.29 වැනි දින අනුරාධපුර ශ්‍රී සාරානන්ද පිරිවෙනේ පැවති දහම් හමුවේ දී සාරානන්ද පරිවේණාධ්‍යක්ෂ, පූජ්‍ය ගිරාඹේ ආනන්ද නායක ස්වාමීන් වහන්සේ කළ අනුශාසනාව**

ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමාට අප, දීර්ඝායුෂ සම්පත්තිය ප්‍රාර්ථනා කරන්නේ ඇයි? මේ රට අද වාගේ තත්ත්වයකට පත්කරගත්තා වූ, මේ රටේ පහළ වෙච්ච ශ්‍රේෂ්ඨ නායකයා එතුමා නිසයි.

ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා පහළ නොවෙන්න, අද අපේ සාමය - සමගිය, සමාදානය, සංවර්ධනය සියල්ලක් ම, ඇනහිට හමාර යි. රටේ සාමය ඇති කළේ එතුමා. කවුරු මොනවා කථා කළත්, මේ අවුරුදු දෙක තුළ අපේ රටේ ජනතාව තුළ ඇති වුණ, ජාතික, ආගමික හැඟීම, මොන තරම් දුරට සංවර්ධනය වෙලා තියෙනවද කියන එක මෙතෙනට මේ එක්රොක් වෙලා සිටින්නා වූ දෙ දහකට අධික සිල් පිරිය ගෙන් අපට පෙනී යනවා.

ගමයි, පාසලයි, පංසලයි කියන මේ ස්ථාන තුන මුල්කරගෙන ශ්‍රීමත් ජනාධිපතිතුමා අදහස් කළේ මනුෂ්‍යයා ගේ චරිත සංවර්ධනය යි. ඒ චරිත සංවර්ධනය තියෙනවා නම්, රටක් සංවර්ධනය කරන්න ඉතා ම පහසු යි. අප හැම දෙනා ගෙ ම සිත් දූෂ්‍ය වෙලා, හැම දෙනා ම ආකූල, ව්‍යාකූල තත්ත්වයකට පත් වෙලා තිබුණ යුගයක ජාතියේ වාසනාවකට පහළ වුණ, ශ්‍රීමත් ජනාධිපතිතුමා ගේ සංකල්පය නිසා, එතුමා ගේ නිර්මල අදහස් නිසා, ඔබ හැම දෙනත් අපත්, අද මේ වාගේ වාසනාවන්ත තත්ත්වයක ජීවත් වෙනවා.

මේ තත්ත්වය අපි ආරක්ෂාකර ගන්න ඕනැ. මෙක අප සංවර්ධනය කරගන්න ඕනැ. මෙක අපි රැක - බලාගන්න ඕනැ. එහෙම නම් අප,

අපේ ජීවිතය වාගේ රකින්න ඕනෑ වස්තුවක්. ශ්‍රීමත් ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා, මේ තරම් මහජන හදවත්වලට කිට්ටු වෙච්ච නායකයකු අප දන්නා කාල සීමාවක් තුළ පහළ වුණේ නෑ. හමු වුණේ නෑ. පුංචි මනුෂ්‍යයා ගේත්, හදවත් හොඳට දැන හඳුනගෙන. ඒ අනුව කටයුතු කළ නිසා තමා, අපට අද නිදහසේ සැනසිල්ලේ ඉන්න පුළුවන්කම ලැබුනෙ. ඒ නිසයි, මේ පිංකම අප සංවිධානය කළේ. රට රකින්න ඕනෑ. ජාතිය රකින්න ඕනෑ. ආගම රකින්න ඕනෑ. ඒ ඔක්කොම රුකෙන්නේ, ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා රැකුනොත් පමණ යි.

ඒනිසා, එතුමන්, රටත්, ජාතියත්, ආගමත්, අප ආරක්ෂා කරගත යුතු යි. මේ ලබාගෙන එන්නා වූ සිංහල අවුරුද්ද මුල් කරගෙන, ඒ අවුරුද්දට පෙර, අද මේ බක් පුර පසළොස්වක දවසේ මහා පිංකමක් කරලා, අප ප්‍රාර්ථනා කරනවා, ජනතාවත්, ආරක්ෂා වේවා ! ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඇතුළු අප හැම දෙනාත්, මැති ඇමති තුමන්ලාත්, සියලු දෙනාත් ආරක්ෂා වෙත් වා කියලා.

## 1991.03.29 වැනි දින අනුරාධපුර ශ්‍රී සාරානන්ද පිරිවෙනේ පැවති දහම් හමුවේ දී පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්, බ්‍රිගේඩියර් ආනන්ද වීරසේකර මහතා කළ කථාව

භීෂණයෙන් රට දෙදරද්දී, භීෂණයෙන් රට ඇවිලෙද්දී, ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා දහස් සංඛ්‍යාත තරුණයන්ට භාර වීමේ, අවස්ථාව ලබාදී, අභය දානය දී, වරදට සමාව දෙන උත්තරීතර චාරිත්‍රය අනුව යමින්, දහසක් දරුවන්ට සමාව දුන්නා. පුනරුත්ථාපනය එහෙම නැත්නම්, ප්‍රතිසංවර්ධනය, නමැති සම්මා සංකල්පය, නිවැරදි සංකල්පය අනුව මේ දරුවන් වැටුණු වලෙන්, ගොඩ ගන්නට වෙනම සංස්ථාවක්, වෙනම දෙපාර්තමේන්තුවක්, වෙනම වැඩසටහනක්, ශ්‍රීමත් ජනාධිපතිතුමා ආරම්භ කිරීමට අපට ධෛර්යය දුන්නා.

පසුගිය වසරේ, මාස 12 කට මෙ දරුවන් ජීවත් කරවීම සඳහා, ශ්‍රීමත් ජනාධිපතිතුමා මිලියන පනස් හයක් වියදම් කර තිබෙනවා. මෙහි දී මධ්‍යස්ථාන 12 ක් ඇති කරලා, විශේෂ පාසල් පහක් ඇති කරලා, ප්‍රතිසංවර්ධන පංසල් පනස් නවයක් ඇති කරල, එතුමා මේ දරුවන්ට ධර්ම දානය, බුද්ධි දානය සහ සම්පත් දානය ලබා දීමට අපට මෙහෙය වූවා. මිනිහා හදනවා කියන්නේ මිනිසාගේ හිත හැදීමයි. එම ආර්‍ය ධර්මය බුදුරජාණන් වහන්සේ අපට දුන්න උපදෙසක්. එම ගැඹුරු ධර්මයට ගරු කරමින් අප හසුරුවන ශ්‍රීමත් ජනාධිපතිතුමා පන්සලේ ගරු සංඝරත්නයට දරුවන් භාරදී විහාර ආශ්‍රිතව පුනරුත්ථාපන වැඩසටහන ආරම්භ කොට අපට ශක්තියක්, ධෛර්‍යයක් ඒ වාගේම අප බොදු මග යා යුතුයි යන්නත් නැවතත් මතක් කර දුන්නා. පන්සල් ආශ්‍රිතව ක්‍රියාත්මක වන මෙ වැඩසටහන දැන් කාගේත් ප්‍රසාදයට ලක්වෙලා.

මේ දරුවන් අතර සියයට අනූ නමයයි දශම අටක් සිංහල බෞද්ධ දරුවන් ඉන්න නිසා මේ වැඩසටහන බෞද්ධ දර්ශනය පදනම් කරගෙන

යත්නක්. එය කරගෙන යාමට එතුමා අපව දිරිගැන්නුවා. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු තුනක් තියෙනවා. පළමුව දරුවන්ගේ මානසික සංවර්ධනයයි. දෙවනුව ඔවුන්ගේ ආර්ථික සංවර්ධනයයි. තෙවනුව නිදහස් වී සමාජ ගතවන දරුවන්ගේ ආරක්ෂාවයි.

මානසික සංවර්ධනය කිරීමට බෞද්ධ දර්ශනය උපයෝගී කර ගන්නවා. පරාභව සූත්‍රයේ එන, කෙනෙක් පිරිහීමට හේතුත්, මංගල සූත්‍රයෙන් කියවෙන මංගල කරුණුත්, එමෙන්ම ගිහි විනය ආදිය මතක් කර ඔවුන්ගේ මනස සකස් කර අවිහිංසාවාදී සංකල්පත්, සත් පුරුෂ ගුණත් උගන්වනවා. භාවනාව අනිවාර්ය කොට තිබෙනවා. හවස් යාමේ තුන් සූත්‍රය කියා දෙමව්පියන් වඳින ගාථාව ශබ්ද නගා කියා නින්දට යන වැඩසටහනක් අප ආරම්භ කර තියෙනවා.

පෙර රජදරුවන් කළ කී හොඳ දේවල් ප්‍රශස්තියෙන්, කවියෙන්, ලිපියෙන්, කතාවෙන් රජදරුවන් ඉදිරියේ ප්‍රකාශ කිරීම චාරිත්‍රයක්ව පැවතුණා. ශ්‍රීමත් ජනාධිපතිතුමනි, මේ වන විට ඔබතුමාගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වූන ද දැනගත යුතුව තිබෙනවා. අදට දරුවන් තුන් දහස් අට සියයක් පූර්ණ නිදහස ලබා තිබෙනවා. තරුණයන් දෙදහස් තුන් සියයක් දෙනා රජයේ ආයතනවලත්, පෞද්ගලික ආයතනවලත් විවිධ වෘත්තීය පුහුණුව ලබනවා. සමූහ ගොවිපලවල් පහළොවක් ලංකාවේ විවිධ ප්‍රදේශවල ඇති කර තිබෙනවා. දෙසිය හැට එක් දෙනෙකුට නව රැකියා ලබා දී තිබෙනවා. පාසැල් සිසුන් පාසැල්වලටත්, විශ්ව විද්‍යාල සිසුන් විශ්ව විද්‍යාලවලටත් ප්‍රතිසංවර්ධනයෙන් පසු යොමු කර තිබෙනවා. මේ කරදරවලට හසු වුණ, කොටු වුණ මේ දරුවන් අතරෙන්, සංස්ථාවල, රජයේ දෙපාර්තමේන්තුවල, පුද්ගලික ආයතනවල, සේවය කළ අයද අප අතරේ හිටියා. මෑතක දී ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ රජයේ, කැබිනට් තීරණයකින්, ඒ අයට පුනරුත්ථාපනයෙන් පස්සෙ, නැවත ඒ ඒ ස්ථානවල ම, රැකියා දිය යුතු බවට, නියෝග ලැබිලා තිබෙනවා. පළාත් සභා මාර්ගයෙන්, බැංකු මාර්ගයෙන්, එක්දහස් තිස් හය දෙනකුට, ණය පහසුකම, මූල්‍ය පහසුකම ලබාදී තිබෙනවා. දරුවන් ගේ කලා සහ සාහිත්‍ය කුසලතාවන් අගයලා, වෙන ම සෞන්දර්ය පාසලක් බිහි කරල තිබෙනවා. මේ කාර්යයන් සාර්ථක ව ඉටු කරගැනීමට, ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ ඇල්ම–බැල්ම නිතර දෙ වෙලේ අපට ලැබෙන බව මම ප්‍රකාශ කරනවා.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය